# 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ධීවර අමාත්‍යාංශය

**මාළිගාවත්ත, කොළඹ -10**

**වැය ශීර්ෂ අංකය : 118**

| අන්තර්ගතය | පිටු අංකය |
|---|---|
| **01. ආයතනික පැතිකඩ** | |
| 1.1. හැඳින්වීම | **03** |
| 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | **04** |
| 1.3. ප්‍රධාන කාර්යයන් | **04** |
| 1.4. සංවිධාන සටහන | **05** |
| 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන | **06** |
| 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල් | **07** |
| 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු | **08** |
| **02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම** | **09** |
| **03. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය** | |
| 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | **10 - 11** |
| 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | **12** |
| 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | **13 - 14** |
| 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් | **15** |
| 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | **16** |
| 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | **16** |
| 3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | **16** |
| 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | **17** |
| 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව | **18 -26** |
| **04. කාර්ය සාධන දර්ශක** | |
| 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | **27** |
| **05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය** | |
| 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | **28** |
| 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් | **28 - 31** |
| **06. මානව සම්පත් පැතිකඩ** | |
| 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය | **32** |
| 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය | **32** |
| 6.3. මානව සම්පත් සංවර්ධනය | **32** |
| **07. අනුකූලතා වාර්තාව** | **33 - 39** |

## 01 - ආයතනික පැතිකඩ

## 1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුද, කලපු හා අභ්‍යන්තර ජලාශ මනාලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන ධීවර කර්මාන්තයක් බිහිකිරීම උදෙසා ධීවර අමාත්‍යාංශයත්, සවයංපෝෂිත ආර්ථිකයක් බිහිකිරීමට අවශ්‍ය පදනමට දායකත්වයක් සැපයීම උදෙසා විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයත් අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කොට ඇත.

ධීවර අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා නෝත්සී ලිමිටඩ් ආයතනය ක්‍රියාත්මක වන අතර, විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, සීමාසහිත සීනෝර් පදනම යන ආයතන ක්‍රියාත්මක වේ.

**"සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති වලට අනුකූලව ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ඇතිකිරීම සඳහා අදාල රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සිදුකිරීම හා නියමිත අණපනත් වලට අනුකූලව ධීවර විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානතම කාර්යභාරය වේ.


## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

| |
|---|
| **දැක්ම**<br>ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම. |
| **මෙහෙවර**<br>වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම. |
| **ප්‍රතිපත්තිමය අරමුණු**<br>• විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම.<br>• ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.<br>• සමුද්‍රිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.<br>• ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.<br>• පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.<br>• ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.<br>• අපනයන ආදායම් ඉහළ නැංවීම.<br>• විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.<br>• ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම. |

## 1.3. ප්‍රධාන කාර්යයන්

- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදන අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

## 1.4. සංවිධාන සටහන


1.4 MINISTRY OF FISHERIES– ORGANIZATIONAL CHART
Hon. Minister
Secretary
Additional Secretary (Admin and Human Resources)
Additional Secretary (Development)
Director General (Planning)
Director General (Technical)
Additional Secretary (Project)
Chief Financial Officer
Chief Internal Auditor
Senior Asst. Secretary
Assistant Secretary (Admin)
Legal Officer
Administrative Officer
Information &communication Technology Office
Translator
Director (Social Development)
Deputy Director/Asst. Director (Social Development)
Deputy Director/Asst. Director (Strategic&Investig
Fishery Community Coordinating Officer
Director (Planning & Monitoring)
Deputy Director/ Asst. Director (Planning)
Deputy Director/Asst. Director (Monitoring)
❖ Statistician
Director (Development & Ocean Resources)
Deputy Director/ Asst. Director (Development)
Deputy Director/Asst. Director (Ocean Resources)
Chief Accountant
Accountant (Finance)
Accountant (Supplies)
Accountant (Payments)
Development Officer
Legal Assistant
Electrical & Technical Artificer
IT Assistant
Radio Program
Dev.. Offic.
❖ Statist. Officer
Statistical Assistant
Management Assistance
Management Assistant
Driver
Office Employer
❖ Those officers are attached to the Department of Census & Statistics.

## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

| | |
|---|---|
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) | **අපේක්ෂිත අරමුණු**-ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය<br><br>**වගකීම්** - කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසි වලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත හඳුන්වාදීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම. |
| නෝත්සී ලිමිටඩ් | **අපේක්ෂිත අරමුණු** - දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම<br><br>**වගකීම්** - 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි |

## විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

| | |
|---|---|
| ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) | **අපේක්ෂිත අරමුණු** - ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය.<br><br>**වගකීම්** - 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම. |
| ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) | **අපේක්ෂිත අරමුණු** - වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය.<br><br>**වගකීම්** - 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරි පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම ඉස්සන් වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම. |
| ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (CFHC) | **අපේක්ෂිත අරමුණු** - ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 20 ක් හා නැංගුරම්පොළවල් 58 ක් පවත්වාගෙන යාම. |
| ලංකා ධීවර සංස්ථාව (CFC) | **අපේක්ෂිත අරමුණු** - මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපල සඳහා දායක වීම.<br><br>**වගකීම්** - 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකෙරේ. |
| සීමාසහිත සීනෝර් පදනම | **අපේක්ෂිත අරමුණු** - ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම.<br><br>**වගකීම්** - 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු,බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරනු ලබයි. |

## 1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අරමුදල්

| ආයතනය | වැඩසටහන් | ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන (රු.මි) |
|---|---|---|
| ධීවර අමාත්‍යාංශය (MF) | නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා සහාය (FSDD) 2.70<br>ධීවර ප්‍රජා සවිබල ගැන්වීම (FSDD) 23.87<br>වෙරළ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩසටහන (FSDD) 27.50<br>හම්බන්තොට, යාපනය සහ මඩකලපුව ඇතුළු මුහුදුබඩ දිස්ත්‍රික්ක 10 ක ධීවර ගම්මාන වැඩිදියුණු කිරීම (FSDD) 30.07<br>ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 32.13<br>ඔරුවැල්ල ධීවර ප්‍රජා ගුවන් විදුලි වැඩසටහන 10.73 | 127.00 |
| | | |
| ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR) | ප්‍රාග්ධන සංවර්ධනය (DFAR) | 98.00 |
| | | |
| වරාය සංවර්ධන ව්‍යාපෘතිය | උතුරු පළාත් තිරසාර ධීවර සංවර්ධන වැඩසටහන (ADB/GOSL) | 52.51 |

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

| අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් සපයන ආයතනය | TEC රු.මි | ව්‍යාපාති කාලය |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකාවේ තෝරාගත් ප්‍රදේශවල මුහුදු ජීවී වගාව සහ වෙරළ ජලජීවී වගාව සංවර්ධනය කිරීම සහ සමුද්‍ර වගාවන්හි නියමු ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම | ඕස්ට්‍රේලියානු ප්‍රදාන | 1,288.00 | අවු. 03 |
| 02. | සම්පත් සිතියම්කරණ ශක්‍යතා විශ්ලේෂණය පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක්, උතුරු පළාතේ වෙරළබඩ හා සමුද්‍ර ජලජීවී වගා සංවර්ධනය සඳහා පවතින ජීව විද්‍යාත්මක හා රසායනික පරාමිතීන් වාර්තා කිරීම. | ILO ප්‍රදාන | 1.322300 | අවු. 03 |
| 03. | නෝර්වේ-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික ව්‍යාපෘතිය - ශ්‍රී ලංකාවේ සාගර සම්පත් කළමනාකරණය වැඩිදියුණු කිරීම - අදියර II 2020-2022 | නෝර්වේ රජය | 225.5 | අවු.03 |
| 04. | ප්‍රංශ රජයේ මූල්‍යාධාර යටතේ හරිත වරායන් ලෙස බෙරුවල, ගාල්ල, පුරාණැල්ල සහ කුඩාවැල්ල යන ප්‍රදේශවල ධීවර වරායන් සංවර්ධනය කිරීම | ප්‍රංශ සංවර්ධන ආධාර | 30,000.00<br>Sovereign Loan- EUR 100.00<br>CF- EUR 20.00<br>Private Sector- EUR 10.00<br>Grant- EUR 8.00<br>Total- EUR 138.0 | අවු.05 |
| 05. | ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ඒඩීබී ව්‍යාපෘතිය) සමඟ අරමුදල් සපයන උතුරේ ක්‍රියාත්මක කරන ලද ධීවර සංවර්ධන ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව | 32,000.00 | අවු.05 |

හුවමාරු වටිනාකම 2020.06.01 දිනට

1 USD = 186.0282 LKR

1 EUR = 203.1570 LKR

## 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජය මඟින් 2020 වසර සඳහා වෙන්කරන ලද සම්පූර්ණ ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 277.51 කි. එම වසර තුල වෙන් කරන ලද ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයෙන් රු.මි.245.873 ක ප්‍රමාණයක් වැය කොට ඇත.

එසේම, 2020 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 428,740 ක් වන අතර කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 326,930 ක් සහ මෙට්‍රික් ටොන් 101,810 ක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයට දායකත්වයක් සපයා ඇත.

ජනතාවගේ පෝෂණ මට්ටම් හා යහපත් සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රෝටීන් මූලාශ්‍රයක් ලෙස මත්ස්‍ය පරිභෝජනය ඉතා වැදගත් වේ. 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 38.4 ක් වුවද එම ප්‍රමාණය ඉදිරි කාලය තුළ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික ආදායමට ධීවර ක්ෂේත්‍රයේ වර්ධනීය දායකත්වය සැළකීමේදී, මත්ස්‍ය අපනයන දායකත්වය ප්‍රශංසාත්මක ලෙස ඉහළ මට්ටමක රැඳී ඇත. 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුලදී, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මෙට්‍රික් ටොන් 21,298 ක් ලෙස වර්ධනය වී ඇති අතර, එහි අපනයන වටිනාකම රු.මි. 39,874 ක් ලෙස වාර්තා වී ඇත.

ගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ධීවර අංශයට අදාළ අභිලාෂයන් සාක්ෂාත් කරගැනිමට පසුගිය වර්ෂය තුල දමන ලද පදනම තවදුරටත් ශක්තිමත් කරමින්, අවශ්‍ය සැළසුම් හා ක්‍රමෝපායන් තවදුරටත් අධිෂ්ඨානශීලී ලෙස ඉදිරියට ගෙනයමින්, කෝවිඩ් වසංගත තත්ත්වය තුළ වුවද, සියලු අභියෝග ජය ගනිමින් අපේක්ෂිත ඉලක්ක සාධනයෙන් සාධනීය ප්‍රතිඵල හා ජයග්‍රහණයන් ලඟාකරගත හැකිවූ අතර ඉදිරි අවුරුදු කිහිපය තුල "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තිය ඉටුකරගනිමින් ඒ හා සමගාමීව එක්සත් ජාතීන්ගේ තිරසර ඉලක්ක සපුරා ගැනීමේ සැලසුම් හා ව්‍යාපෘති දියත් කිරීම කෙරෙහි අවධානය යොමු කොට ඇත.

## 03 - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය
## 3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | තතය 2020 | 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,297,590,000 | 1,747,738,080 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 72,423,742 | 222,988,576 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 9,587,110 | 11,568,346 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 33,188,439 | 72,344,835 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,412,789,292** | 2,054,639,837 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,412,789,292** | 2,054,639,837 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 116,020,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 115,100,728 | 89,417,008 | ඒසීඒ-2(ii) |
| 78,890,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 73,692,403 | 86,968,938 | ඒසීඒ-2(ii) |
| 45,010,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 42,665,990 | 1,238,475,767 | ඒසීඒ-2(ii) |
| - | පොලී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 80,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 21,000 | 36,000 | ඒසීඒ-2(ii) |
| 240,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **231,480,121** | **1,414,897,713** | |
| | **මූලධන වියදම්** | | | | |
| 24,803,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 15,572,043 | 9,979,580 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 87,697,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 81,982,353 | 84,930,869 | **ඒසීඒ-2(ii)** |
| 63,425,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | 60,723,000 | 417,187,360 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 1,000,000 | හැකියා වර්ධනය | **14** | 745,000 | 1,346,610 | |
| 138,575,000 | වෙනත් මූලධන වියදම් | **15** | 135,363,711 | 1,894,039,867 | |
| 315,500,000 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **294,386,107** | **2,407,484,287** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **297,838,757** | **135,798,667** | |
| | **තැන්පතු ගෙවීම්** | | 290,404,961 | 124,755,478 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 7,433,796 | 11,043,189 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | 823,704,985 | 3,958,180,668 | |
| 555,500,000 | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | 589,084,306 | (1,903,540,831) | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | සත්‍ය | |
|---|---|---|---|
| | සටහන | 2020 | 2019 |
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 605,570,552 | 523,782,990 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 23,951,810 | 26,106,309 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **629,522,361** | **549,889,299** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (36,920,002) | (252,746,720) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 605,570,552 | 523,782,990 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 60,871,811 | 278,853,029 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **629,522,361** | **549,889,299** |

පිටු අංක 5 සිට 63 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 64 සිට 75 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

...........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2021.02.25
ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10.

...........................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2021.02.26
කේ.පී.මිල්ටන් එස්. පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැ.බ)
ධීවර අමාත්‍යාංශය
ලේකම් වෙනුවට
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත, කොළඹ - 10

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ජීසීජ්-සී

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | - |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 33,020,565 | 63,536,644 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | - | - |
| අග්‍රිම ලැබීම් | | 1,297,590,000 | 1,736,038,080 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **1,330,610,565** | **1,799,574,724** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 223,316,255 | 207,759,595 |
| සහනාධාර සහ මාරුකිරීම් | | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 11,658,626 | 1,977,784 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 30,000,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **264,974,881** | **209,737,380** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **1,065,635,684** | **1,589,837,345** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපණය අයකර ගැනීම් | | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 643,907 | 654,048 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **643,907** | **654,048** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | | 1,060,330,513 | 1,644,751,085 |
| අත්තිකාරම් ගෙවීම් | | 5,293,786 | 6,045,666 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | | |

| | | |
|---|---|---|
| | **1,065,624,299** | **1,650,796,751** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(1,064,980,392)** | **(1,650,142,703)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **655,292** | **(60,305,359)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 10,897,412 | 148,165,930 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **10,897,412** | **148,165,930** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 11,552,704 | 87,860,572 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **11,552,704** | **87,860,572** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(655,292)** | **60,305,359** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

### 3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුදල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාල නොවේ | | | | |

### 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 240,000,000 | 240,000,000 | 231,480,121 | 96.45 |
| ප්‍රාග්ධන | 265,500,000 | 315,500,000 | 294,386,107 | 93.31 |

### 3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

| අ. අං | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 01 | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරි (පුහුණු) තනතුරු වෙනුවෙන් ගෙවීම් කිරීම. | 120,000 | 120,000 | 120,000 | 100% |
| 02 | ධීවර රාජ්‍ය අමාත්‍යාංශය | 2020.08.31 දක්වා රාජ්‍ය අමාත්‍යාංශයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ගෙවීම් කිරීම | 829,521,246 | 829,521,246 | 829,521,246 | 100% |
| 03 | ධීවර හ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | පොදු වියදම් වෙනුවෙන් ගෙවීම් කිරීම | 6,350,027 | 6,350,027 | 6,350,027 | 100% |
| 04 | මැතිවරණ දෙපාර්තමේන්තුව | මැතිවරණ රාජකාරි වෙනුවෙන් ගෙවීම් කිරීම | 560,248 | 560,248 | 560,248 | 100% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

**රු. 000**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | 145,386,103.09 | | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | 334,758,285.59 | | |
| 9153 | ඉඩම් | | 3,336,250.00 | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | 122,089,912.90 | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | - | | |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

FLS/B/MF/2/20/01 — 2021 ජූලි 07 දින

ලේකම්

ධීවර අමාත්‍යාංශය

**ධීවර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ධීවර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය 2020 අගෝස්තු 31 දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කළ නොහැක.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**(i) අත්තිකාරම් ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.9,587,110ක් දක්වා තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව (එස්ඒ-52) අත්තිකාරම් මුළු ලැබීම් රු.3,994,958 ක් වුයෙන් රු.5,592,152 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ii) වෙනත් ලැබීම්**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව වෙනත් ලැබීම් රු.33,188,439 ක් වූවද අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව එම ශේෂය 9,509,705 ක් විය.

#### 1.6.1.2 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව අත්තිකාරම් ගෙවීම් මුළු එකතුව රු.7,433,796ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව (ඒස්ඒ-52) අත්තිකාරම් මුළු ගෙවීම් රු.27,946,768 ක් වුයෙන් රු.20,512,972 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ACA-6 වාර්තාවේ 2020 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු.523,782,990 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය (එස්ඒ-82) අනුව එවැනි ආරම්භක වත්කම් ශේෂ වටිනාකමක් දක්වා නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම රු.605,570,552ක් ලෙස දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර වාර්තාවේ (එස්ඒ-82) රු. 57,290,189ක් ලෙස දක්වා තිබුණෙන් නිරීක්ෂණය වූ රු. 548,280,363ක වත්කම්වල වෙනස සසඳා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය ACA -6 පරීක්ෂා කිරීමේදී 2020 වර්ෂයේ වත්කම් මිලදී ගැනීම් එකතුව රු.81,787,561ක් ලෙස දක්වා තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් අත්පත් කරගැනීම් රු.81,982,353ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.194,792ක වෙනසක් විය.

(ඈ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.13 ඡේදය ප්‍රකාරව ගිණුම් සාරාංශ මඟින් වාර්තා කරන අ. ස්ථාවර වත්කම්හි උපලේඛනයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අමාත්‍යාංශය වර්ෂය තුල අත්පත් කරගත් රු. 81,982,353ක වත්කම් පිළිබඳව උපලේඛනයක් ඉදිරිපත් කළ බවට තොරතුරු නොතිබුණි.

### 1.6.2.2 තැන්පත් ගිණුම් ශේෂ

(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ට අදාල අංක 06 මාර්ගෝපදේශයන් හි 8.3 ප්‍රකාරව තැන්පතු ගිණුම්වලට අදාළ ගිණුම් වෙන වෙනම පිළියෙල කර විගණකාධිපතිට පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2020 ජනවාරි 01 දිනට තැන්පත් ශේෂ අගයන්, වර්ෂය තුල බැර කිරීම්, වර්ෂය තුල හර කිරීම් ආදී ප්‍රමාණවත් විස්තර ඇතුළත් ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 571(2) හා (3) ප්‍රකාර විස්තර ලැබෙන තෙක් තැන්පතු ගිණුමක අවිනිශ්චිතව තබාගෙන ඇති මුදල්, ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතැබීම මත එම විධිවිධානවලට යටත්ව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එසේ රාජ්‍ය ආදායමට බැර කළ හැකි වසර 2 ක ඉක්ම වූ රු.1,625,268 ක තැන්පතු අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ තැන්පතු ශේෂයෙහි පැවතිණි.

### 1.6.2.3 අත්තිකාරම් ගිණුමේ ශේෂය

ධීවර අමාත්‍යාංශයේ 2020 වර්ෂය සඳහා ණය අත්තිකාරම්වලට අදාල සීසී 10 ලේඛන 2021 මාර්තු 2 දිනැති අංක FLS/B/MF/2/20/1/INF 01දරන ලිපියෙන් හා වාචිකව වරින්වර ඉල්ලා සිටිය ද මෙම වාර්තාවේ දිනවන තෙක් විගණනය වෙත ඉදිරිපත් නොකළ අතර 2020 දෙසැම්බර් 31 දිනට රු.23,951,810 ක අත්තිකාරම් ශේෂය සත්‍යාපනය කළ නොහැකි විය. එසේම වර්ෂය තුළ මුදලින් කරන ලද අත්තිකාරම් ගෙවීම් හා ලැබීම් පිළිවෙලින් රු.5,344,686 ක් හා රු.5,333,285 ක් සිගාස් මාසික වාර්තා මගින් ද තහවුරු නොවිය.

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ශේෂ පිරික්සුම සැසඳීමේදී පහත සඳහන් අයිතමයන්ගේ වටිනාකම් අතර එකතුව රු. 2,077,438,762 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

| අයිතමය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව | අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ආදායම් නොවන ලැබීම් | 33,020,565 | 9,509,706 | 23,510,859 |
| අග්‍රිම ලැබීම් | 1,297,590,000 | 271,740,000 | 1,025,850,000 |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් | 223,316,255 | 219,472,451 | 3,843,804 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් වියදම් | 11,658,626 | 9,760,647 | 1,897,979 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 643,907 | 2,902,069 | 2,258,162 |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන | 1,060,330,513 | 57,484,980 | 1,002,845,533 |
| අත්තිකාරම් ගෙවීම් | 5,293,786 | 4,479,806 | 813,980 |
| තැන්පතු ලැබීම් | 10,897,412 | 1,014,255 | 9,883,157 |
| තැන්පතු ගෙවීම් | 11,552,704 | 5,017,416 | 6,535,288 |
| | | | 2,077,438,762 |

### 1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා විදේශ ණය අරමුදල් මගින් 2020 වර්ෂය තුල සෘජුවම භාණ්ඩාගාරයෙන් රු.43,399,817ක් වැය කර ධීවර අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ දක්වා තිබුණු අතර මෙම වියදම පිළිබඳව ධීවර අමාත්‍යාංශයෙන් හෝ ධීවර රාජ්‍ය අමාත්‍යාංශයෙන් හෝ තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා විගණනයේදී සතුටුදායකව සත්‍යාපනය කළ නොහැකි විය.

(ආ) කොවිඩ් වසංගතය හේතුවෙන් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිලිපදිමින් පැලියගොඩ මත්ස්‍ය වෙළඳ සංකීර්ණය නැවත ආරම්භ කිරීම සඳහා සංවර්ධන සහයන් යටතේ ගොඩනැඟිලි සහ ඉදිකිරීම් සිදු කිරීමට ලබා දුන් රු.50,000,000ක් වියදම් කිරීම පිළිබඳව පසුවිපරම් සිදුකළ බවට තොරතුරු නොවිය.

(ඇ) ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නමින් තැන්පතු ලැබීම් රු.1,850,219 ක් හා තැන්පතු ගෙවීම් රු.13,668,508 ක් ද ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය නමින් තැන්පතු ලැබීම් රු.55,368,334 ක් හා තැන්පතු ගෙවීම් රු.55,955,044 ක් ද අංක සඳහන් නැති ජ'නල්සටහන් 2 ක් මඟින් තැන්පතු ලැබීම් රු.2,895,912 ක් ද අංක සඳහන් නැති ජ'නල් සටහන් 2 ක් මඟින් තැන්පතු ගෙවීම් රු.208,129,819 ක් ද ගැලපීම් කර තිබුණ ද එම මුළු ලැබීම් රු.60,114,465ක් හා මුළු ගෙවීම් රු.277,753,372 ක් සඳහා තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(ඈ) මුදල්රෙගුලාසි 272(3) ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර අදාල මාසය අවසානයේ සිට සති 6කට නොවැඩි කාලයක් ඉකුත්වීමට මත්තෙන් විගණකාධිපති වෙත මසක් පාසා එවිය යුතු වුවද ධීවර අමාත්‍යාංශයේ 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා දළ වශයෙන් රු. 265,704,593 ක වියදමට අදාල ගෙවීම් වවුචර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඒ නිසා එම වියදම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

(ඉ) 2020 දෙසැම්බර් මස රු.15,541,473 කට අදාල වැරදි නිවැරදි කිරීම මඟින් වැය විෂයයන්ට කරන ලද ගැලපීම් සඳහා ප්‍රමාණවත් මාරු පත්‍ර/ ජ'නල් සටහන් තොරතුරු පිළියෙල කර නොතිබුණු බැවින් පරීක්ෂා කළ නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

මූල්‍ය ප්‍රකාශයේ ඒසීඒ -3හි අංක 89/20දරණ අග්‍රිම ගිණුම අනුව භාණ්ඩාගාරයෙන් ලැබීම් රු.272,740,000ක් ලෙස දක්වා තිබුණද අමාත්‍යාංශ ශේෂ පිරික්සුම අනුව එම ප්‍රමාණය රු.271,740,000ක් ලෙස දක්වා තිබුණි.

### 2.2 වියදම් කළමනාකරණය

ධීවර අමාත්‍යයාංශය 2020 වර්ෂය සඳහා 1101 දේශිය ගමන් වියදම් වෙනුවෙන් වෙන්කර තිබුණු රු.2,280,000 ක ප්‍රතිපාදනය සියයට 52.6 කට සමාන රු.1,200,000 කින් රු.3,480,000ක් දක්වා ශුද්ධ ප්‍රතිපාදනය වැඩි කරගෙන සංවර්ධන ව්‍යාපෘතින්හි ප්‍රගතිය සොයාබැලීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් දිවයිනේ විවිධ ප්‍රදේශවල වැඩි වශයෙන් රාජකාරියන්හි යෙදවීමට රු 3,272,824ක් වැය කළ බව සඳහන් කර තිබුණ ද වර්ෂය අවසන් වී මාස 3ක් ඉක්මවා ගිය ද 2021 මාර්තු 31 දිනවන විටත් සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

ධීවර අමාත්‍යාංශයේ අංක 151-2-3-5-2506 දරණ වැය විෂයයට අදාල ධීවර ප්‍රජාව බලගැන්වීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් 2020 වර්ෂය සඳහා රු.23,870,000ක ප්‍රතිපාදන සලසාගෙන එයින් රු.23,791,914ක් වැය කර තිබුණු අතර තවත් රු. 4,979,666ක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ගෙවීමට බැඳීම් ඇතිකරගෙන තිබුණි. ප්‍රතිපාදන ඉතිරිය රු.78,086ක් වීම නිසා මෙම බැඳීමත් සමඟ රු.4,901,580ක ප්‍රතිපාදන ඉක්මවීමක් නිරීක්ෂණය විය. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශය ධීවර ප්‍රජාව බලගැන්වීමේ ව්‍යාපෘතියෙන් ලඟා කරගත් ප්‍රගතියක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමක් හෝ මත්ස්‍ය බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ ඉලක්ක ගත අරමුණු අත්පත් කරගෙන ඇත් ද යන්න පිළිබඳ පරීක්ෂාවක් හෝ සිදුකර නොතිබුණි.

2.4 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ විගණන විමසුම් 07 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.5 තැන්පතු

අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පත් (6000-0-016-0-21) ශේෂය 2020 දෙසැම්බර් 31 දිනට රු.60,107,736 ක් වූ අතර එයින් රු.55,677,614 ක් අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට අදාල කාර්යසාධන සුරක්ෂණය හා අත්තිකාරම් සුරක්ෂණය 2019 සැප්තැම්බර් 12 දින මුදල් කරගැනීමෙන් ලැබුණු මුදලක් විය. අත්තිකාරම් සුරක්ෂණය හඳුනාගෙන රාජ්‍ය ආදායමට සෘජුවම ගත යුතුව තිබුණු අතර වර්ෂයකට වැඩි කාලයක් ඉකුත්ව ඇතත් අත්තිකාරම් සුරක්ෂණය රාජ්‍ය ආදායමට ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්යසාධනය

---

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

---

(අ) 2020 වර්ෂය සඳහා අංක 151-2-03-005-2506 දරන ධීවර ප්‍රජාව බලගැන්වීම වැය විෂයය වෙනුවෙන් රු.23,870,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දින දක්වා වියදම රු.23,791,973.71 විය. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය පරිපාලන වියදම් සඳහා රු. 1,500,000ක මූල්‍යමය ප්‍රතිපාදනයක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබාදීම හැර ඉතිරි රු.22,291,974 ක මුදල 2019 වර්ෂයේ සිදුකරන ලද ව්‍යාපෘතින්හි අතැති බිල්පත් පියවීම සඳහා උපයෝජනය කර තිබුණි.

(ආ) 2020 වර්ෂය සඳහා අංක 151-2-03-002-2202 දරන සංවර්ධන සහායන් වැය විෂයය වෙනුවෙන් රු.2,700,000.00 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දින වනවිටත් 2020 ක්‍රියාකාරි සැලැස්ම අනුව අදාල ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අපේක්ෂා කර තිබූ ඉස්සන් නිරෝධායන පහසුකම් ඇති කිරීම (මූලික කටයුතු) හා මුහුදු කූඩැල්ලන් ගම්මානය සඳහා මැණුම් කිරීම යන කාර්යයන් සිදුකිරීමට ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ඇ) වෙරළ සංරක්ෂණය හා සම්පත් කළමනාකරණය කිරීමේ වැඩසටහන (37-2104) හා ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන (53-2506) සඳහා 2020 වර්ෂයේ ධීවර අමාත්‍යාංශය විසින් පිළිවෙලින් රු.27,290,360 ක් හා රු.31,961,270 ක් වැය කර තිබුණු අතර ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මාසික වැය සාරාංශ මගින් මෙම එකතුව වූ රු.59,251,630ක් අමාත්‍යාංශ වැය ලෙජරයේ සටහන් කර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘති දෙකක් ඉලක්ක කරන ලද මත්ස්‍ය බීජ නිෂ්පාදනය (Fish Seed Production) ඉහළ නැංවීම සිදුවී ඇත් ද යන්න පිළිබඳ පරික්ෂා කර නොතිබීම හා 2020 දෙසැම්බර් 31 දිනට අත්කරගත් ප්‍රගතිය පිළිබඳ වාර්තා ද පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

---

2020 වර්ෂය සඳහා අංක 2104-037-03-2-151 දරන වැය විෂයය වෙනුවෙන් රු.44,500,000ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට වියදම රු.27,290,360ක් විය. 2020 ක්‍රියාකාරි සැලැස්ම අනුව අදාල ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මන්නාරම් දිස්ත්‍රික්කයේ මුහුදු කූඩැල්ලන් සඳහා අභිජනනාගාර ඉදිකිරීම, පුත්තලම දිස්ත්‍රික්කයේ විසිතුරු මසුන් සඳහා අභිජනනාගාර ඉදිකිරීම හා පම්බල මිරිදිය ඉස්සන් අභිජනනාගාර වැඩි දියුණු කිරීම යන කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කර ඇතත් ප්‍රගතියක් ඉදිරිපත් කර නොතිබුණු අතර ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ප්‍රතිලාභය ලැබී තිබුණේද යන්න සම්බන්ධයෙන් පරික්ෂාවක් සිදු කර නොතිබුණි.

### 3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

එච්.එන්.රණතුංග

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

## 04 - කාර්ය සාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% | |
| 2020 වර්ෂයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 428,740 කින් වැඩිකිරීම | | √ | | $\frac{428,740}{567,420}$ X 100 = 75.6 |
| එක් දිනක් තුළ ග්‍රෑම් 38.4 කින් ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම | | √ | | $\frac{38.4}{48}$ X 100= 80 |

## 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

### 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .

| ඉලක්ක / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50%- 74% | 75%- 100% | |
| තිරසාර සංවර්ධන ඉලක්කය 14 | 2020 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 460,000 කි | මෙ.ටො 428,740 | | | √ | $\frac{428,740}{460,000}$ X 100 = 93 |
| තිරසර සංවර්ධන ඉලක්ක 12 | 2020 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 107,420 කි | මෙ.ටො. 101,810 | | | √ | $\frac{101,810}{107,420}$ X 100 = 95 |
| | 2020 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 48 දක්වා වැඩිකිරීම | දිනකට ග්‍රෑම් 38.4 | | | √ | $\frac{38.4}{48}$ X 100 = 80 |

### 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.

#### 5.2.1. හැඳින්වීම

**අරමුණු 14** - තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිතා කිරීම

**අරමුණු 12** - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සහතික කිරීම

**හැඳින්වීම**

**අරමුණු 14 –**වෙරළාසන්න සහ සාගර සම්පත්, සාගර ලොවපුරා මානව වර්ගයේ යහ පැවැත්ම, සාමාජීය සහ ආර්ථික සංවර්ධනයෙහිලා විශාල කාර්යභාරයක් ඉටු කරන බව අවධාරණය කරනු ලැබේ. සාගර මගින් ජීවනෝපාය සහ සංචාරක ප්‍රතිලාභ හිමිකර දෙන අතරම යැපීම් සහ ආදායම් මාර්ගද ලබාදේ. වර්ෂ 2030 අරමුණු ලඟා කර ගැනීමේදී සාගර හා වෙරළබඩ පරිසර පද්ධති සහ ඒවා තිරසාර අයුරින් උපයෝජනය සහ සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වන අතර මෙම ගෝලීය සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරීම තිරසාර අනාගතයක් වෙනුවෙන් තීරණාත්මක කාරණාවකි.

**අරමුණු 12 –**තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය යනු සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, මූලික සේවා සඳහා, හරිත සහ යෝග්‍ය රැකියා සඳහා ප්‍රවේශ වීමේ හැකියාව මෙන්ම උසස් ජීවන තත්වයක් ළඟාකර ගැනීමයි.

| දර්ශකය සහ උප දර්ශකය | මූල කාරණය | වගකිවයුතු ආයතනයන්හි ප්‍රකාශ |
|---|---|---|
| **අරමුණු 14** - තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිතා කිරීම | | |
| ජෛව තිරසාර මට්ටම තුල මත්ස්‍ය තොග මට්ටම | ධීවර අංශයේ තිරසාර බව, තොග බහුලත්වය, මත්ස්‍ය සංඛ්‍යා ලේඛන, ධීවර ප්‍රයන්න දත්ත මත නිර්වචනය කරයි. මත්ස්‍ය තොග තක්සේරු කිරීමට ජෛව තොරතුරු අවශ්‍ය වේ. | නියාමන මිනුම් NARA සහ ධීවර දෙපාර්තමේන්තුව සිදු කරයි. |
| නීති විරෝධී, වාර්තා නොවන සහ නියාමනය නොකල මසුන් ඇල්ලීම මැඩ පැවැත්වීමට අන්තර්ජාතික ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමේ මට්ටම | නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම සඳහා ජාත්‍යන්තර ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමෙහි මට්ටම 90% ක් ලෙස ඉන්දියානු සාගර ටූනා කොමිසමේදී පිළිගෙන ඇත. | නීති විරෝධී ධීවර කටයතු මැඩපැවැත්වීමට ධීවර දෙපාර්තමේන්තුව, NARA සහ NAQDA යන ආයතන මගින් වගකිව යුතු ධීවර කර්මාන්තය සහ අන්තර්ජාතික ක්‍රමවේද අනුගමනය සඳහා වන චර්යා පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. |
| සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත්, අඩු සංවර්ධනයක් සහිත රටවල් සහ සියලු රටවල දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස තිරසාර ධීවර කර්මාන්තය | 2020 වසර දළ දේශීය නිෂ්පාදිතයට ධීවර අංශයේ දායකත්වය 1.3% | ජලජ සම්පත් තිරසාර ලෙස උපයෝජනය සඳහා ධීවර දෙපාර්තමේන්තුව සහ NARA යන ආයතන මගින් නියාමනය කරන ලදී. |
| කුඩා පරිමාණ ධීවර කටයුතු සඳහා ප්‍රවේශ වීමේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා වන නෛතික/නියාමන, ප්‍රතිපත්ති සහ ආයතනික රාමු භාවිතයේදී ප්‍රමාණාත්මක බව | කුඩා පරිමාණ ධීවරයින් සඳහා ප්‍රවේශවීමේ අයිතීන් ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීමට ආයතනික හා ආයතනික නොවන මට්ටමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ධීවර දෙපාර්තමේන්තුව සහ NARA ආයතන මගින් නියාමනය කරන ලදී. |
| එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතීන්ට අනුව සාගර සංරක්ෂණය හා තිරසාර භාවිතය සඳහා නෛතික ප්‍රතිපත්ති, ආයතනික ක්‍රම, සාගර නීති ක්‍රියාත්මක කිරීමේ සාගර හා සම්බන්ධ ක්‍රමවේද ඔස්සේ බලාත්මක කිරීම, පිලිගැනීම සහ ක්‍රියාත්මක කිරීම. | මෙහි අරමුණු වන්නේ,<br>- සම්පත් තිරසාර බව හා සම්පත් භාවිතා කරන්න් අතර ප්‍රතිලාභ සමානව බෙදීම සහතික කිරීම<br>- ධීවර හා ජලජීවී වගාවේ තිරසාර සංවර්ධනය සඳහා තීරණ ගැනීමේදී සහභාගීත්ව ප්‍රවේශය ශක්තිමත් කිරීම<br>- දැනට පවතින රෙගුලාසි සමාලෝචනය කිරීමෙන් පසුව ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා වේදිකාවක් සැපයීම<br>- ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජීවී වගා කර්මාන්තය දැනුම පදනම් කරගත් නවීන තිරසාර කර්මාන්තයක් බවට පරිවර්තනය කිරීම | ධීවර හා ජලජ සම්පත් ප්‍රතිපත්ති ප්‍රකාශනය පදනම් කරගෙන මෙම ප්‍රගතිය නිර්ණය බලාත්මක කිරීම හා ප්‍රවේශය මත සිදු කරන අතර ධීවර අමාත්‍යාංශයේ නීති රාමුව හරහා UNCLOSE හා එකී ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිර්ණය කරයි. |
| **අරමුණු 12** - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සහතික කිරීම | | |
| **ආහාර හා අලාභ දර්ශකය** | | |
| සැපයුම් දාමයෙහි අදියර වලදී මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන විනාශ වීම(සාගර මසුන්) | කාලය සමග සැපයුම් දාමය ඔස්සේ ආහාර විනාශ වීමේ ප්‍රතිශතයෙහි වෙනස් වීම් පිළිබඳ දර්ශකය, අස්වනු ලබාගැනීමේ අවදි, පසු අස්වැන්න සමග හඳුනාගත් ප්‍රධාන නිර්නායක මත පදනම්ව ආහාර අලාභ දර්ශකය ගනනය කළ යුතුය. ප්‍රවාහනය, ගබඩා කිරීම, සකස් කර බෙදා හැරීම, ඇසුරුම් කිරීම ආදී කරුණු සලකා බලයි. | අදාල දත්ත ධීවර දෙපාර්තමේන්තුව හා NARA ආයතනය සතු වේ. |

### 5.2.2. අවස්ථා

1. ඉන්දියන් සාගර ටූනා කොමිසම (IOTC) වැනි ජාත්‍යාන්තර සම්මුති ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම.
2. වගකීමක් සහිත ධීවර කර්මාන්තයක් ශක්තිමත් කිරීම වෙනුවෙන් නොර්වේජියානු රජය, ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ලෝක පරිසරය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමය (IUCN), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වැනි විදේශීය ආධාර සපයන නියෝජිතායතනයන්ගේ ඉදිරිපත් වීම හා දක්වන සහයෝගය.
3. ධීවර සම්පත් ප්‍රශස්ත අන්දමින් භාවිතා කිරීමේ ක්‍රමෝපාය.
5. ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සහ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ හැකියාව.
6. ධිවර ප්‍රජාවන් අතර මසුන් ඇල්ලීම පිළිබඳ ගැටුම් අවම කිරීම.

### 5.2.3. අත්කරගත් ජයග්‍රහණ

1. නීතිවිරෝධී ආම්පන්න භාවිතය හා ආනයනය තහනම් කිරීම.
2. පරිසරය විනාශ නොවන පරිදි මත්ස්‍ය අස්වනු නෙලා ගැනීමට අවශ්‍ය ආම්පන්න භාවිතා කරන ධීවර ජනතාව ධෛර්යමත් කරළීම සඳහා දිරිගැන්වීම් ක්‍රම යොදා ගැනීම.
3. පශ්චාත් අස්වනු හානිය අවම කර ගැනිමට අවශ්‍ය තාක්ෂණය භාවිතය සඳහා පුහුණුවීම් හා දැනුවත් භාවය ඇතිකරලීම
4. පරිසරය විනාශ නොවන පරිදි මත්ස්‍ය අස්වනු නෙලා ගැනීමට අවශ්‍ය ආම්පන්න භාවිතා කරන ධීවර ජනතාව ධෛර්යමත් කරළීම සඳහා දිරිගැන්වීම් ක්‍රම යොදා ගැනීම.
5. හරිත වරාය සංකල්පය ඇතුළු ධීවර වරාය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
6. දේශීය හා විදේශීය ආයෝජකයින්ට මත්ස්‍ය ආශ්‍රිත සම්පත් ගුවන් මගින් අපනයනයට පහසුකම් සැලසීම.
7. ගැඹුරු මුහුදේ මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීම හා මත්ස්‍ය සම්පත් වල අගය වැඩි දියුණු කිරීම තුලින් පසු අස්වනු හානිය අවම කරලීම හා ඒ තුලින් දළ දේශීය නිෂ්පාදනය සඳහා වන දායකත්වයේ වර්ධනයක් ඇති කිරීම.
8. සහභාගීත්ව කළමනාකරණ ක්‍රමවේද යොදාගැනීම
9. ශිල්පීය හා කලපු ධීවරයින් වැනි අවම ආදායම් ලබන ධීවරයින් සඳහා විකල්ප ජීවනෝපායන් සංවර්ධනය කිරීම.
10. ධීවර භූමි වැඩි දියුණු කිරීම සඳහා FAD පද්ධතිය ප්‍රවර්ධනය කිරීම.
11. පරිසරය ආශ්‍රිත සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීමට සාම්ප්‍රදායික ධීවර යාත්‍රා යොදාගැනීම(විශේෂයෙන් කලපු ධීවර කර්මාන්තය තුළ)

### 5.2.4. අභියෝග

1. වෙරළබඩ සම්පත් බොහොමයක් විද්‍යාත්ම සාක්ෂි නොමැතිව දුර්වල ලෙස කළමනාකරණය කර ඇත. ඇතැම් අවස්ථාවල සම්පත් භාවිතා කරන්නන් දුර්වල ලෙස අධීක්ෂණය කිරීම තුලින් සම්පත් අධික ලෙස සූරා කෑම සහ විනාශ වීම සිදුවේ. එබැවින් කළමනාකරණය කරන්නන්ගේ සහ පරිශීලනය කරන්නන්ගේ සංරක්ෂණය හා කළමානාකරණය පිළිබඳ ආකල්ප වර්ධනය කල යුතුය. මීට අමතරව පවත්නා නීතිය බලාත්මක කිරීමට බලාත්මක කිරීමේ නිලධාරීන්ට නිසි දැනුම හෝ පහසුකම් ලබාදීම අවශ්‍යාව ඇත.
2. ධීවර හා සාගර අංශ සම්බන්ධ නවීන පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම ලබාගැනීමට තාක්ෂණික හා මූල්‍යමය බාධා හේතු වී ඇත. සාමාන්‍ය ජනතාව අතර සමුද්‍ර පරිසර පද්ධති වල වටිනාකම පිළිබඳ දුර්වල දැනුවත්භාවය ඒවා විනාශ වීමට හේතුවේ. විවිධ ආයතන අතර කාර්යභාරයන් එකිනෙක අතිපිහිත වී පැවතීම තුල අවසානයේ කිසිවකු වගකීම භාර නොගනී. ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැතිවීම බරපතල කාරණයකි.
3. ඉන්දියානු ධීවරයින් ශ්‍රී ලංකා මුහුදු සීමාව උල්ලංඝණය කොට මත්ස්‍ය සම්පත් නෙලාගැනිම
4. නීතිවිරෝධී හා හානිදායක පරිදි මසුන් ඇල්ලීමේ අවදානමක් පැවතීම
5. ධීවර කර්මාන්තයේ තිරසාර බව සහ ධිවර ප්‍රජාවන්ගේ ජීවනෝපාය සහතික කිරිම
6. පරිසර පද්ධති පදනම් කරගත් ධිවර කළමනාකරණය ක්‍රියාවට නැංවීම.
7. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දුර්වලතා.
8. කළමනාකරණය සහ මත්ස්‍ය වෙළඳාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.
9. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව
10. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම

## 06 - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 27 | 19 | 08 |
| තෘතීයික | 05 | 04 | 01 |
| ද්විතියික | 96 | 76 | 19 |
| ප්‍රාථමික | 51 | 41 | 10 |

### 6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ.

සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

### 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු. '000) | | වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රියදුරු පුහුණු වැඩ සටහන | 13 | දින 01 | 20,000/- | - | දේශීය | පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාව ඉහළ නංවා ඇත. |
| කාර්යාල ක්‍රම | 55 | දින 01 | 5,000/- | - | දේශීය | |

## 07 - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | | |
| 1.6 | වෙනත් | | | |
| **02** | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,2 | පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2,3 | විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරිම ( මූ.රෙ 135)** | | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය නිසා ප්‍රමාදවීම් සිදුවීම | කඩිනමින් පිළිතුරු ලබාදිමට නියමිතය |

| | | | | |
|---|---|---|---|---|
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිව රයාසමඟසාකච්ඡාකිරීමෙන්අනතු රුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | කොරෝනා වසංගතය නිසා ප්‍රමාදවීම් සිදුවීම | කඩිනමින් පිළිතුරු ලබාදීමට නියමිතය |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | වාර්තා වැඩි ප්‍රමාණයක් නියමිත දිනට ඉදිරිපත් කර ඇති අතර කොරෝනා ව්‍යසනය හේතුවෙන් වාර්තා කිහිපයක් නියමිත දිනට ඉදිරිපත් කිරිමට නොහැකි විය. | 2021 වර්ෂයේදී සිදුකිරීමට නියමිතය. |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල නොවේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල නොවේ | අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා විධිමත් පරිදි මු.රෙ. 66 හා 69 යටතේ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන ප්‍රතිපාදන සළසා ගෙන ඇත. | |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වර්ෂ 20කට වඩා පැරණි ණය ශේෂ වල තොරතුරු සොයාගැනීමට නොහැකි වීම | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම | අදාල නැත | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නැත | | |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නැත | | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |